# "දෘෂ්ටිවාද" බෞද්ධ විචාරයේ සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක්

## A Study of the Peculiarities of Buddhist Criticism "Drishtivāda"

පනාමුරේ චන්දිම හිමි

---

**Abstract**

In today's society, even if it is only about Buddhism, an attempt is being made to create different ideologies and protect each other. It is possible to reduce this conflict of views by getting a correct understanding regarding ideologies. Among the objectives of this research is that. It is also expected to study what are the important points in arriving at a certain ideology.

Since the beginning of human civilization, it has been human nature to stick to some ideology. There was a revival of ideology in AD. B.C. It can be seen how man has been drawn into the grip of ideologies through every teaching such as Indian philosophy, Western philosophy, Chinese philosophical teachings, which are considered to be world philosophical ideologies of the 6th century. According to Buddhism, a person is always prone to ideologies. This is explained by the words Ditti Parāmāsa, Ditti Gahana. To touch an ideology is not to know any ideology at all. Taking ideology seriously, getting to the bottom of it, thereby making sense. Buddhism calls this Ditti Abhinivesa and Ditti Gahana. When a certain ideology is taken as an attitude, it comes to the conclusion that its own opinion is right and all others are wrong. (Idameva Saccan Moghamaññaṁ).

Buddhism recognizes freedom from external influences as the mental forces that can see reality. That state is called

oneness of mind or concentration. There are no various cravings in a concentrated mind. There are no different ideologies. No prejudice. The guidance needed to achieve that kind of mental freedom can be obtained by being non-ideological.

**Key words:-** Ideologies, Philosophies, Man, Truth, Non-ideological

**හැඳින්වීම**

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම මිනිසාගේ ස්වභාවය වන්නේ කිසියම් මතවාදයක ඇලී සිටීමයි. දෘෂ්ටිවාද පිළිබඳ ප්‍රබෝධයක් ඇති වූ ක්‍රි. පූ. 6 වන සියවසේ ලෝක දාර්ශනික මතවාදයන් ලෙස සැලකෙන භාරතීය දර්ශනවාද, අපරදිග දර්ශනවාද, චීන දාර්ශනික ඉගැන්වීම් ආදී සෑම ඉගැන්වීමක් තුළින්ම මිනිසා මතවාද ග්‍රහණයට යොමු වී ඇති ආකාරය දැකිය හැකිය. බුදුදහමට අනුව පුද්ගලයා නිරන්තරයෙන් මතවාද වෙත නැඹුරුවන ස්වභාවයෙන් යුක්තය. මෙය දිට්ඨි පරාමාස, දිට්ඨි ගහණ යන වචනවලින් විග්‍රය කොට ඇත. මතවාදයක් ස්පර්ශ කිරීම යනු කිසියම් මතවාදයක් යන්තමින් දැනගෙන සිටීම නොවේ. මතවාදය දැඩිව ගැනීම, එහි පතුලට කිඳා බැසීම, එමගින් අර්ථවත් කරයි. බුදුදහම මෙය දිට්ඨි අභිනිවේස සහ දිට්ඨි ගහණ යනුවෙන් හඳුන්වා ඇත. යම් මතවාදයක් අභිනිවේස වශයෙන් ගත් විට තම මතයම නිවැරදිය අන්මත සියල්ල වැරදිය යන නිගමනයට එළඹෙයි. (ඉදමෙව සච්චං මොඝමඤ්ඤං (දීඝනිකාය, I සීලඛන්ධ වග්ගය, සාමඤ්ඤඵල සූත්‍රය, 100 පිටුව. 1972)

ඉන්පසුව තම මතයම තහවුරු කිරීමට මිනිසා දරණ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් අතර විවිධාකාර ගැටලු ඇති වෙයි. එබැවින් බුදු දහම අවධාරණය කරන කරුණු වන්නේ කිසිඳු මතවාදයකට දැඩිව ග්‍රහණය නොකර සිටීම යහපත් වන බවයි. (දිට්ඨිං ච අනුපගම්ම) (ඛුද්දකනිකාය, සුත්තනිපාතය, උරගවග්ගය, මෙත්ත සුත්ත, 02 පිටුව. 1972)

ලොව පවත්නා ආගම් හා දර්ශන විසින් දෙයාකාරයක දෘෂ්ටිවාද ලෝකයාට දායාද කරයි. මිනිසාගේ පැවැත්ම දිගින් දිගටම පවත්වාගෙන ගොස් අවසානයේ ස්ථිර විමුක්තියක් අපේක්ෂා කිරීම

එක් දෘෂ්ටියකි. මරණයෙන් කෙළවර වන ජීවයක් පිළිබඳ සාකච්ඡා කර දැක්වීම විභව තණ්හා මූලයයි. එමගින් ඇතිවන්නේ උච්ඡේද දෘෂ්ටියයි. බුදු දහම මෙම දෙයාකාර වූ දෘෂ්ටිවාද දෙකම ප්‍රතික්ෂේප කරයි. ඒවා හීන ග්‍රාම්‍ය අනාර්ය යන වදන් මගින් ප්‍රතික්ෂේප කොට ඇති ආකාරය දැකිය හැකිය. (හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථ සංහිතො) (මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසකය, දෙවදහ වග්ගය, දෙවදහ සූත්‍රය, 1972)

විශේෂයෙන් බුද්ධකාලීන දිට්ඨිවාද, සුද්ධිවාද, අන්තයෝග, උපාදාන, ආදි යෙදුම් තුළින් මෙම මතවාද ග්‍රහණය පිළිබඳ අදහස් දැකිය හැකිය. (සන්ති භික්ඛවේ එකෙ සමණබ්‍රාහ්මණො එවං වාදිනො එවං දිට්ඨිනො) ආත්මවාදයෙන් යුක්ත වූත් ආනාත්මවාදයෙන් යුක්තවූත් නොයෙක් ආකර දෘෂ්ටිගතිකයන් ලෝකයේ උත්පත්තිය ලබන බව දක්වා ඇත. (යා ඉමා භන්තෙ අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති අත්තවාද පටිසංයුත්තා වා ලොකවාද පටි සංයුත්තාවා) (මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, මූලපරියාය වග්ගය, සල්ලෙක සුත්ත, 94 පිටුව. 1972)

ශාස්වත දිට්ඨි හා උච්ඡෙද දිට්ඨි යන මෙම දෘෂ්ටිවාදවලට පොදු වූ මූලික සාධකය නම් ආත්මයයි. මරණයෙන් කෙළවර නොවන ආත්මයක් ඇතැයි සිතීම ශාස්වත දිට්ඨි වන අතර මරණයෙන් කෙළවරවන ආත්මයක් ඇතැයි ප්‍රකාශ කිරීම උච්ඡෙදවාදයයි. මෙම මතවාදවලින් එකක් තම අභිමතය පරිදි පිළිගැනීම මිනිසාගේ ස්වභාවයයි. මෙහිදී වැදගත්වන අදහසක් වන්නේ ශාස්වතවාදයේ ක්‍රියාකාරීත්වය අත්තකිලමතානුයෝගය තුළින් ප්‍රකාශිත වීමයි.

එබැවින් බුදුදහම තුළ දෘෂ්ටි හෝ මතවාද පිළිබඳ බහුපාර්ශවික විග්‍රහයක් දැකිය හැකිය. එම විග්‍රහය මූලික වශයෙන් පහත මාතෘකා යටතේ විග්‍රහ වෙයි.

01. ආචාර විද්‍යාත්මක විචාරය

02. වාග් විද්‍යාත්මක විචාරය

03. ඥානමීමංසාත්මක විචාරය

04. මනෝ විද්‍යාත්මක විචාරය

05. තර්කවාදාත්මක විචාරය වශයෙනි.

මතවාදය තීරණය වන්නේ මිනිසාගේ අවශ්‍යතා මත මිස මතවාදයේ අවශ්‍යතාමත නොවේ. එබැවින් ඕනෑම මතවාදයක ඉහත දක්වන ලද ස්වරූපයන් දැකිය හැකිය.

**පර්යේෂණයේ අරමුණ**

මතවාද සම්බන්ධයෙන් කෙරෙන මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ඒ සම්බන්ධයෙන් නිරවුල් නිවැරදි අවබෝධයක් ලබා ගැනීමයි. මෙම අදහස සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් නොමැති නිසා විවිධාකාරයේ දෘෂ්ටිවාද පිළිගත් බොහෝ දෙනා දෘෂ්ටි ඝට්ටනයක් තුළ ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය.

බුදුදහම සම්බන්ධයෙන් පමණක් වුවද විවිධාකාර වූ දෘෂ්ටිවාද ගොඩනගා ගනිමින් එකිනෙකා පරයමින් ගොඩ නැගෙන්නට දරණ උත්සාහයක් වර්තමාන සමාජයේ දැකිය හැකිය. මතවාද සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් මෙම දෘෂ්ටි ඝට්ඨනය අවම කිරීමට අවස්ථාව ලැබේ. මෙම පර්යේෂණයේ අරමුණු අතර එයද වේ. එසේම යම් මතවාදයකට එළඹීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද යන්න අධ්‍යයනය කිරීමද මෙමගින් අපේක්ෂා කෙරේ.

බුදුදහම මූලික වශයෙන් ඇරඹෙන්නේ ශරීරයට අධික දුක් දීමත් ශරීරයට අධික සැප දීමත් යන මතවාද දෙකම ප්‍රතික්ෂේප කිරීමෙනි. ඒවා අර්ථ සම්පන්න ආගමික ජීවිතයකට හෝ ජීවිතයේ යථාර්ථය කියාපාන දර්ශනයකට මග නොපෙන්වන බව බුදුදහම අවධාරණය කරයි. එකී මතවාද දෘෂ්ටිගතික වීමට උපකාර වන්නේ නමුදු සසර දුක් කෙළවර කිරීමට උපකාර නොවන බව බුදු දහම පෙන්වා දෙයි.

මිනිසා වැරදි සහගත මතවාදවලට යොමු කරවන හේතු කිහිපයක් බුදු දහම පෙන්වා දෙයි. ඒවා නම් සතර අගතිය සහ ත්‍රිවිධ අකුසල මූලයන්ය. ඡන්ද දෝස භය මෝහ යන සතර අගතියෙන් තොර වීම මතවාද තුළින් වෙන්වීමට හේතු වෙයි. මිනිසා මතවාද

තෝරා ගන්නේ සතර අගති එකකින් හෝ කිහිපයකින් යුක්ත වීම හේතුවෙනි.

මිනිසාගේ සියලු තීරණවලට හෝ මතවාදවලට අකුසල මූල අඩු වැඩි වශයෙන් බලපායි. රාග ද්වේශ මෝහ යන අකුසල මූලයන්ගෙන් නිදහස් වී තීරණ ගැනීමට මිනිසාට නොහැකිය. අකුසල මූලයන් මගින් යථාර්ථය ආවරණය කරනු ලබයි. මේ අනුව මතවාද යනු අකුසල මූලයන්ගෙන් තොර නොවූ දෘෂ්ටිවාදයන්ය.

යථාර්ථය දැකිය හැකි මානසික බලවේගයන් හැටියට බුදු දහම හඳුනාගන්නේ බාහිර බලපෑම්වලින් නිදහස් වීමය. සිතෙහි එකගබව හෙවත් සමාධිය යනුවෙන් හඳුන්වන්නේ එම තත්වයයි. සමාධිමත් සිතෙහි විවිධාකාර වූ තෘෂ්ණා නැත. විවිධාකාර වූ මතවාද නැත. අගතිද නැත. එබඳු ආකාරයේ මානසික නිදහසක් උදාකර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම මතවාදවලින් තොර වීමෙන් හෙවත් දෘෂ්ටිගතික නොවීමෙන් ලබා ගත හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

මෙම පර්යේෂණයේ දී සාහිත්‍ය විමර්ශන ලෙස සැලකිය හැකි ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් දැකිය නොහැකිය. විශේෂයෙන් මෙම මාතෘකාව සම්බන්ධව ලියවුණු සාහිත්‍ය කෘතියක් මා හට හමු වූයේ නැත. එහෙත් දෘෂ්ටිවාද සම්බන්ධයෙන් ලියවුණු බොහෝ ග්‍රන්ථ ප්‍රමාණයක් දැකිය හැකිය. විශේෂයෙන් එම මාතෘකාවට සම්බන්ධව ලියවුණු කෙටි ලිපි කිහිපයක් පමණක් දැකිය හැකිය. ප්‍රාථමික මූලාශ්‍රයන් කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යෙමු කරනු ලැබේ. ඊට හේතුව වන්නේ මෙම පර්යේෂණයේදී දත්ත විශ්ලේෂණය යටතේ එම කරුණු ගොනු කිරීමට අපේක්ෂා කිරීමයි. ඊට අමතරව බෞද්ධ දර්ශනය සම්බන්ධව ලියවුණු ඇතැම් ග්‍රන්ථයන්වලද මෙම මාතෘකාවට අදාළව තොරතුරු ඇතුළත් වී ඇත. එසේ ඇතුළත් වී ඇති තොරතුරු මෙසේ පිළිවෙලින් ඉදිරිපත් කළ හැකිය.

බෞද්ධ දර්ශනය (පරි.)

හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

675, පී. ද. ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මෙම ග්‍රන්ථයේදී බෞද්ධ දර්ශනයේ මූලික සංකල්ප විග්‍රහයට ලක්වී ඇති අතර සමකාලීන දාර්ශනික මතවාද බොහෝ සෙයින් විචාරයට ලක්වී ඇත. සමකාලීන සමාජයේ මතවාද බෞද්ධ දර්ශනයේ ඇතුළත් වී ඇති ස්ථානයන් විශේෂයෙන් උද්ධෘත කරමින් මෙම පරිවර්තනය සිදු කොට ඇත. බලදේව උපාධ්‍යායයන් විසින් රචිත බෞද්ධ දර්ශනය නම් ග්‍රන්ථයේ පරිවර්තනයක් වන මෙහි මාගේ පර්යේෂණයට අදාළ බොහෝ කරුණු ඇතුළත් වී ඇත. එහෙත් මතවාද වශයෙන් නොව දෘෂ්ටිවාද ලෙස ගෙන කරුණු විග්‍රහකර ඇත.

මුල් බුදු සමයෙහි ආචාර විද්‍යාව

ඩී. ජේ. කලුපහන

තිවිර ප්‍රකාශන 2005.

මෙම පර්යේෂණයට සම්බන්ධව සිදුවුණ ඉතාම සුවිශේෂි ග්‍රන්ථය වන්නේ මෙයයි. මතවාද පිළිබඳ ප්‍රාග් බෞද්ධ අදහස් මෙන්ම ඒවායේ අත්‍යන්ත පරිණාමය පිළිබඳ විග්‍රහයක් මෙහි ඇතුළත් වී ඇත. මෙම ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේදීම මතවාද සම්බන්ධව විග්‍රහයක් ඉදිරිපත්කර කර ඇත. මිනිස් ජීවිතයේ ඇතැම් අංශ විස්තර කිරීමේදී මතවාද උපයෝගිකර ගන්නා ආකාරය පැහැදිලිව දක්වා ඇත. මාගේ පර්යේෂණයට බොහෝ සෙයින් උපකාරවන ග්‍රන්ථයක් ලෙස දැක්විය හැකිය.

බෞද්ධ භික්ෂු සමාජය

දේවාලේගම මේධානන්ද හිමි,

ආරිය පොත් ප්‍රකාශකයෝ, මරදාන, කොළඹ 10, 1990.

මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමියන් විසින් රචනා කර ඇති මෙම ග්‍රන්ථය තුළ ද මතවාද මූලික කරගෙන ආරම්භ වූ භික්ෂු සමාජය පිළිබඳ තොරතුරු විශාල ප්‍රමාණයක් දැකිය හැකිය. එහිදී සාකච්ඡාවට ලක්කර ඇත්තේ භික්ෂූන් වහන්සේලා මුල්වී ඇති වූ මතවාද ඒ ඒ යුගවලදී ඇති වූ සෑම බුදුවරයෙකුගේම සාසනයන් තුළ දැකිය හැකිව තිබූ ලක්ෂණයකි යන්නයි. මාගේ පර්යේෂණයේදී මෙම ග්‍රන්ථය ද බෙහෙවින් උපකාර වෙයි.

බෞද්ධ ලෝක දෘෂ්ටිය

සමන්ත ඉලංගකෝන්

සමන්ති පොත් ප්‍රකාශකයෝ, හෙට්ටිගම, ජා ඇල. 2007.

භාරතීය චින්තනය තුළ බෞද්ධ දර්ශනයට හිමිවන ස්ථානය මෙන්ම විවිධ දෘෂ්ටිවාද පිළිබඳවත් ඒ ඒ දෘෂ්ටිවාදයන්හි ආදීනව පිළිබඳවත් මෙම පර්යේෂණයේදී කරුණු දක්වා ඇත. දෘෂ්ටිවාද පිළිබඳ නව ආකාරයෙන් විමර්ශනය කිරීමට පෙළඹී ඇති ආකාරය දැකිය හැකිය. මාගේ පර්යේෂණයට උපයෝගිවන ග්‍රන්ථයක් ලෙස දැක්විය හැකිය.

විවරණ

පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමි

සංස්. මහමිතව පඤ්ඤාරතන හිමි

රත්මල්වැටියේ සමිත හිමි

මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, මිරිස්වත්ත පුවක් පිටිය, 2009.

පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමියන් විසින් විවිධ අවස්ථාවන්වලදී රචනා කරන ලද ලිපි එකතුවක් මෙහි ඇතුළත් වී ඇත. එහි එන විවිධ නිකායික ආචාරවාදයන්ට තුඩු දුන් දාර්ශනික මත(1-18පිටු) මාගේ පර්යේෂණයේ දී උපකාර කරගත හැකිය. මතවාද

ඔස්සේ දාර්ශනික සංකල්ප ගොඩනැගෙන ආකාරය එහි දී පැහැදිලි කොට ඇත.

ඉහත සඳහන් ග්‍රන්ථයන්ට අමතරව මෙම මාතෘකාවට අදාළව සිදු වී ඇති වෙනත් පර්යේෂණයන්ද පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපෙක්ෂා කෙරේ.

ඉහත සඳහන් ග්‍රන්ථයන්ට අමතරව මෙම මාතෘකාවට අදාළව සිදු වී ඇති වෙනත් පර්යේෂණයන්ද පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපෙක්ෂා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේදී මූලික පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථාධාර ක්‍රමවේදයයි. පර්යේෂණ මාතෘකාවට අදාළව පළවී ඇති කෘති පරිශීලනය කරමින් පර්යේෂණය සිදු කරන අතර විෂයයෙහි ප්‍රවීණයන් සමගද මේ සම්බන්ධව තොරතුරු සාකච්ඡා කරන්නට අපේක්ෂා කෙරේ.

මාතෘකාවට අදාළව ලියවී ඇති ග්‍රන්ථ පරිශීලනය කරමින් මෙම පර්යේෂණයට අදාළ දත්ත ලබා ගැනීමට අපේක්ෂා කරන අතර විශේෂයෙන් සූත්‍ර පිටකයෙහි අන්තර්ගත මතවාද හෝ දෘෂ්ටි අධ්‍යයනය කරමින් පර්යේෂණයට අදාළ ලෙස පෙලගස්වමින් දත්ත විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

මතවාද හෝ දෘෂ්ටිවාද යන සංකල්පය විශ්ලේෂණය කරමින් පර්යේෂණයට ප්‍රවේශ වන අතර සූත්‍ර පිටකය තුළ දැකිය හැකි මතවාද පිළිබඳ විශ්ලේෂණය කිරීම සිදු කෙරේ. එසේම විවිධ සූත්‍රධර්මයන් තුළ අන්තර්ගත දෘෂ්ටිවාද හෝ මතවාද මෙම පර්යේෂණය මගින් විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කෙරේ.

**ආචාර විද්‍යාත්මක පදනම**

මතවාද පිළිබඳ ආචාරාත්මක ප්‍රවේශයක් සිදු කරන කල්හි මිනිසා ස්වභාවයෙන් ම තම යහපත අගය කරයි. ඔහු සිදු කරන සෑම ක්‍රියාවකම අවසානික ඵලය වන්නේ ස්වාර්ථයයි. සෑම අවස්ථාවකම

තම යහපත අපේක්ෂා කරන මිනිසා ඒ වෙනුවෙන් වැරදි ක්‍රියාවන්වල ද යෙදනු දැකිය හැකිය. ස්වභාවයෙන් ම අන්‍යයන් ගැන නොසලකන ස්වභාවයක් මිනිසා තුළ ඇත. අන්‍ය යහපත නොසලකා හැරීමත් තම යහපත සිතීමත් යන ක්‍රියාවලියේ දී ආචාරාත්මක සංකල්ප වැදගත් වෙයි.

මිනිසාට ආත්මයක් ඇතැයි යන මතවාදය සමාජගත වී ඇත්තේ තම යහපත ගැනම සිතන බැවිණි. තමා තුළත් බාහිර ලෝකය තුළත් නොවෙනස්වන ආත්මයක් ඇතැයි යන මිනිසා තුළ ඇති කල්පනාව ආත්මවාද නම් වේ. මෙකී තැතිගැන්මෙන් යුක්ත මිනිසා එයින් මුදවාගනු වස් ක්‍රියා කිරීම පිණිස මතවාද ගොඩ නැගී ඇති බව බුදු දහමේ නිගමනයයි.

බුද්ධ කාලයේ පැවති මතවාද හැට දෙකක් ප්‍රතික්ෂේප කිරීමට බුදුදහම ක්‍රියා කර ඇත. පටිච්ච සමුප්පාද න්‍යාය පිළිබඳ දන්නා කල්හි පූර්වාන්ත හෝ අපරාන්ත දෘෂ්ටීන් ගොඩ නැගීමට උනන්දු නොවන බව මහාතණ්හා සංඛ්‍යය සූත්‍රයේදී දක්වා ඇත. (මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, මහා යමක වග්ගය, මහා තණ්හාසංඛය සූත්‍රය, 602 පිටුව. 1972)

එහිදී බුදුන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේ ප්‍රශ්න කිහිපයක් අසයි.

1. දෘෂ්ටි ගොඩනැගීමේ සාවද්‍යතාව පිළිගන්නේ ශාස්තෘ ගෞරවය නිසා ද?

2. අපගේ ශාස්තෘවරයා පිළිගන්නා නිසා අපත් එසේ පවසමුයි නිසා ද?

3. මේ දර්ශනය දන්නෙමු තමත් දර්ශනයක් අපේක්ෂා කරමු?

4. මෙසේ දන්නෙමු දත්තෙමු යැයි පවසමින් බමුණන්ගේ ඉගැන්වීම් සාර යැයි පිළිගන්නවා ද?

මෙම ප්‍රශ්න කිරීම්වලින් පසුව බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් විමසා සිටියේ සාන්දෘෂ්ටික වූ අකාලික වූ පැමිණ

බලන්නයි කීමට යෝග්‍ය වූ ප්‍රඥාවන්තයන් විසින් ප්‍රත්‍යාත්ම වශයෙන් දත යුතු ධර්මය මා විසින් දේශනා කරන ලදි.(එම) මතවාදවලට එළඹීම සම්බන්ධයෙන් මෙම සූත්‍ර දේශනාවෙන් කරන ඉදිරිපත් කිරීම ඉතා ප්‍රශස්තය.

මතවාදවලට එළඹීම සම්බන්ධයෙන් වැදගත් ප්‍රකාශයක් සංයුක්ත නිකායේ දුතිය අනිච්ච සූත්‍රයේ දැක්වෙයි. එහි සඳහන් වන ආකාරයට ''රූපය වින්දනය සංජානනය අභිසංස්කරණය විජානනය යන උපාදානස්කන්ධ ක්‍රියාවලිය අනිත්‍යය. අනිත්‍යය බැවින් දුක් සහිතය. දුක් සහිත බැවින් ආත්ම සාර වශයෙන් ගැනීමෙහි අයෝග්‍යය. එය මම වෙමි. එය මගේ නොවේ. මාගේ ආත්මය නොවේ. ආදි වශයෙන් සම්‍යග් ප්‍රඥාවෙන් යථාර්ථය දකී. එසේ වූ විට ද කිසිදු දෘෂ්ටියකට නො එළඹෙයි. දෘෂ්ටි නැති විට දැඩිව අල්ලා ගැනීමක් සිදු නොවේ. එවිට ස්කන්ධවලට සිත නො ඇලෙයි. නො ඇලෙන බැවින් ආශ්‍රවයන්ගෙන් මිදෙයි. ආශ්‍රවයන්ගෙන් මිදුණු විට සිත විමුක්ත වෙයි. විමුක්ත සිත ඇති කල්හි කළ යුතු සියල්ල කර අවසන් වෙයි. රහත් බව සඳහා තවත් කළ යුත්තක් නැත. මෙමගින් පැහැදිලි වන්නේ දෘෂ්ටිගතික නොවීම හෝ මතවාදවලට නො එළඹ සිටීම විමුක්තියට හේතුවන බවයි.

බුද්ධ කාලයේ පැවති මතවාද බොහෝමයක් ප්‍රතික්ෂේප කිරීමට බුදුදහම ඉදිරිපත් වී ඇත්තේ සදාචාරාත්මක පදනමක පිහිටාය. තිත්ථායතන යන විශේෂ නාමයෙන් මතවාද යන්න ඉදිරිපත් කර ඇත. අංගුත්තර නිකායේ මහාතිත්ථායතන සූත්‍රයේ එවැනි මතවාද තුනක් දක්වා ඇත.

1. ඊශ්වර නිර්මාණවාදය
2. පුබ්බේකතහේතු වාදය
3. අහේතු අප්පච්චය වාදය (අංගුත්තරනිකාය, තික නිපාතය, මහා වග්ගය, මහාතිත්ථායතන සූත්‍රය, 311 පිටුව. 1972)

මෙහි ඊශ්වර නිර්මාණවාදය යන්නෙන් අදහස් වන්නේ සියල්ල සර්වබලධාරී දෙවියෙකු විසින් මවන ලද්දේය යන මතවාදය පිළිගැනීමයි. සියල්ල සිදු වන්නේ බාහිර බලවේගයක ඕනෑකම

අනුව නම් මිනිසාගේ ක්‍රියාවලට වගකිව යුත්තේ ද එම බලවේග යයි. පුබ්බේතකහේතු වාදය තුළින් ඉදිරිපත් වන්නේ සියල්ල පෙර කරන ලද කර්මයන්ට අනුව සිදුවන බවයි. අහේතු අප්පච්චය වාදය යන්නෙන් අදහස් වන්නේ සියල්ල අහේතුකව සිදුවන බවයි. මෙම මතවාද තුනම නියතිවාද නමින් හඳුන්වා ඇත. ඒ අනුව නියතිවාද සියල්ල බුදු දහමින් ප්‍රතික්ෂේප කර ඇත.

මෙහිදී බෞද්ධ සදාචාරය කම්මවාද කිරියවාද හා විරියවාද යන වදන් වලින් යුක්තය. බුද්ධ කාලීනව පැවති මතවාද මෙම අදහස් වලින් යුක්ත මතවාදයක් ඉදිරිපත් නොවීය. බුදු දහමේ එන සදාචාරය සුවිශේෂී වන්නේ ඉහත දක්වන ලද අංග වලින් යුක්ත සදාචාරයක් නිර්දේශ කර ඇත.

**ඥානමීමාංසාත්මක පදනම**

දෘෂ්ටිවාදවලට එළඹීම සම්බන්ධයෙන් ඥානමීමාංසාත්මකව පරීක්ෂා කිරීමේදී මතවාදයක අත්‍යවශ්‍ය අංගයක් නම් ඥානවිභාග යයි. එක් මතවාදයක් තවත් මතවාදයකින් වෙනස් වන්නේ සෑම මතවාදයකම එයටම ආවේණික වූ ඥානවිභාගාත්මක පදනමක් ඇති නිසාය. භාරතීය මතවාදවල භාවිත ඥාන මාර්ග තුනක් මූලික වශයෙන් දැකිය හැකිය. එයින් ද බුද්ධිය හා තර්කය මෙන්ම අධිකාරිය ද මෙයට උපකාරී වෙයි. අනුස්සව යන්නෙන් ද ඥාන මාර්ගීය ක්‍රියාවලියක් අදහස් වෙයි. දෙවියන් හෝ යම් සර්ව බලධාරී අයෙක් තවකෙකුට ප්‍රකාශ කරන ලද දෙයක් මිනිසුන් විසින් පිළිගෙන එම මාර්ගයේ ගමන් කරන්නේ නම් එය අනුස්සව නමින් හඳුන්වා ඇත. අනුස්සව වශයෙන් සැලකෙන හෙවත් කවරෙකුගේ හෝ අනාවරණයකින් ප්‍රකාශිත ඥාන මාර්ගයන්හි දෝෂ කිහිපයක් බුදුදහම ප්‍රකාශ කරයි.

1. සුස්සුතං තථා
2. සුස්සුතං අඤ්ඤතා
3. දුස්සුතං තථා
4. දුස්සුතං අඤ්ඤතා (මජ්ඣිමනිකාය, මජ්ඣිමපණ්ණාසකය, පරිබ්බාජක වග්ගය, සන්දක සූත්‍රය, 317පිටුව. 1972)

මෙමගින් අදහස් වන අර්ථ වන්නේ මනාව අසා දිගු කලක් පවත්වා ගෙන එන සත්‍ය මතවාදයන්ය. දෙවැන්න වන්නේ මනාව පවසන ලද අසත්‍ය මතවාද වේ. තුන්වැන්නෙන් අදහස් වන්නේ මනාව නො අසන ලද සත්‍ය මතවාදයන්ය. සිව්වැන්නෙන් අදහස් වන්නේ මනාව නො අසන ලද අන්‍ය මතවාදයන්ය. මෙමගින් ගම්‍ය වන්නේ අනුස්සය තුළින් ලබාගන්නා ඥාන මාර්ගය දෝෂ සහිත බවයි. එහි ප්‍රධාන වශයෙන් ගැටලු තුනකි. එනම්,

- ඇසීමේ දෝෂ ඇතිවිය හැකිය.
- පවත්වාගෙන ඒමේ ගැටලු ඇතිවිය හැකිය.
- සත්‍ය අසත්‍ය ගැටලුව ඇතිවිය හැකිය.

මේ අනුව අනුස්සවය පදනම් කරගත් ඥාන මාර්ගය අවිස්වාසයෙන් තොරව ග්‍රහණය කළ නොහැකිය. තර්කය සම්බන්ධයෙන් ද බුදුදහම ඉදිරිපත් කරන්නේ ද සුබදායක අදහසක් නොවේ. එහි ද සතරාකාර ප්‍රභේදයක් ඉදිරිපත් කරයි.

1. සුතක්කිතං තථා
2. සුතක්කිතං අඤ්ඤතා
3. දුත්තක්කිතං තථා
4. දුත්තක්කිතං අඤ්ඤතා (එම)

මෙයින් අර්ථවත් වන්නේ ද නිවැරදිව තර්ක කොට නිවැරදි නිගමන ද නිවැරදි තර්ක කර වැරදි නිගමන ද වැරදියට තර්ක කොට වැරදි නිගමන ද වැරදියට තර්ක කොට හරි නිගමන ද එළඹිය හැකිය. තර්කය අනුව මතවාදවලට එළඹීම ද සුදුසු නොවන බව මේ අනුව පැහැදිලි වේ.

මතවාද පිළිබඳ බෞද්ධ ඥාන මීමාංසාත්මක විචාරය තුළ අවධාරණය කෙරෙන තවත් විශේෂ කරුණක් නම් පූර්වාන්ත හා අපරාන්ත දෘෂ්ටි ග්‍රහනයේදී මූලික වශයෙන් ආත්ම ඇත නැත යන

අදහස් මූලික කරගෙන ඇතිවන බවයි. ආත්මයට ආරම්භයක් ඇත සහ ආත්මයට ආරම්භයක් නැත. යන මතවාද පදනම් කරගෙන අන්තවාද ගොඩනැගෙන බවයි.

අනිත්‍ය දර්ශනයට නොපැමිණි ආත්මවාදි සංකල්පයක පිහිටා එහි අතීතය වර්තමානය හා අනාගතය යන අවස්ථාවන් තේරුම් ගැනීමට උත්සාහ කිරීමේ අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ දෘෂ්ටිවාද භජනය කිරීමයි. අතීතය අනුසාරයෙන් මම කවුරුන් වූයේද? නොවූයේද? කවරෙකුව සිට කවරෙකු වූයේද අනාගතයෙහි වෙයිද නොවෙයි ද කවුරුන් වෙයි ද සත්වයා කොයින් කොහි යන්නෙක් ද? ආදී වශයෙන් විවිධ මතවාදවලට එල්බ සිටියි. මෙය අයෝනිසෝ මනසිකාරය ලෙස සලකන බුදු දහම එමගින් දෘෂ්ටිවාද සයකින් එකකට හෝ කිහිපයකට අයත් වන බව සබ්බාසව සූත්‍රයේ සඳහන් වෙයි. (මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, මූලපරියාය වග්ගය, සබ්බාසව සූත්‍රය, 22 පිටුව. 1972)

1. මාගේ ආත්මය ඇත.

2. මාගේ ආත්මය නැත.

3. ම විසින්ම ආත්මය හැඳිනිමි.

4. ම විසින්ම අනාත්මය හැඳිනිමි.

5. අනාත්ම වූ මා ආත්මය හැඳින ගතිමි.

6. ආත්මය නිත්‍යව සදාකාලිකව පවති.

මේ ආකාරයට ආත්ම සංකල්පයක් ගොඩනගා ගත් කල්හි ඒ අනුසාරයෙන් විවිධාකාර දෘෂ්ටිවාද හෝ මතවාද නිර්මාණය කර ගැනීම සත්ත්වයාගේ ස්වභාවයයි. එහෙත් බුදු දහම අවධාරණය කරන්නේ අනන්‍ය වූ සාරයක සම්බන්ධයක් නොමැතිව ප්‍රත්‍ය සාපේක්ෂතාවක් මත සසර ගමන සිදුවන බවයි. ආත්මය ඇතැයි බුදු දහම පිළිනොගැනීම එහි සුවිශේෂත්වයක් වෙයි.

සසර සම්බන්ධව දක්වා ඇති අදහස් තුළින් පැහැදිලි වන්නේ ද පුද්ගලයා දෘෂ්ටිගතික වන ආකාරය හේතුඵල සම්බන්ධතාව මත සසර පැවැත්ම සිදුවන ආකාරය බුදු දහම අවධාරණය කළ ද එය නිවැරදිව ග්‍රහණය කර නොගත් භික්ෂූන් වහන්සේලා බුද්ධකාලීනව සිට ඇත. සාති නම් භික්ෂුව ඒ අනුව වැරදි දෘෂ්ටි ගොඩ නගාගත් භික්ෂුවකි. උන් වහන්සේගේ අදහස වූයේ නොවෙනස් වන එකම විඤ්ඤාණයක් භවයෙන් භවය සැරිසරන බවයි. (ඛුද්දකනිකාය, පරායන වග්ගය, මොඝරාජ සූත්‍රය, 325 පිටුව. 1972) බුදුන් වහන්සේ එම මතය සපුරා වැරදි බව දක්වා ඇත. ප්‍රත්‍ය සම්බන්ධතාවයකින් තොරව විඤ්ඤාණය ප්‍රභවය නොවන බව උගන්වා ඇත.

**වාග් විද්‍යාත්මක පදනම**

ස්වාභාවික ලෙස පුද්ගලයාගේ මුඛයෙන් පිටවන විවිධ ශබ්ද අදාළ කරගෙන ශබ්ද ගොඩනගා ගනු ලබන සෑම පදයකට ම නිශ්චිත වූ අර්ථයක් ඇතැයි විශ්වාස කරයි. සාමාන්‍ය මිනිසාගේ ස්වරූපය වන්නේ භාෂාව මගින් යථාර්ථය නිරූපණය වේ යැයි සිතීමයි. සියලු දෘෂ්ටිවාදවලට මිනිසා ගොදුරු වීමට ප්‍රධාන හේතුව වන්නේ භාෂාව පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිවීම නිසාවෙනි.

භාෂාවේදී භාවිත වන පුද්ගලයා සත්වයා පුරුෂ ස්ත්‍රිය යන පද භාවිත වෙයි. එම වදන්වලින් අර්ථවත්වන අයෙකු සිටී යැයි කල්පනා කරයි. එසේ නොසිටි නම් එම පද භාෂාවේ පවතින්නේ කෙසේ දැයි ඔහු කල්පනා කරයි. සත්වයා යනු පංචස්ඛන්ධය හැඳින්වීමේ සම්මුතියක් පමණි. පංචස්ඛන්ධය හැරුණු විට සත්වයෙක් හෝ පුද්ගලයෙකු කියා අනන්‍ය වූ ස්වභාවයක් නැත. එය සංයුක්ත නිකායේ වජිරා සූත්‍රයේදී වජිරා භික්ෂුණිය පැහැදිලි කරන්නේ මෙසේය.

යථාහි අංග සම්භාරො - හොති සද්දො රථො ඉති

එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති.

(සංයුත්තනිකාය, සගාථවග්ගය, භික්ඛුණී සංයුත්තය, භික්ඛුණී වග්ගය, 247 පිටුව. 1972)

විවිධ කොටස් එකතු වීමෙන් රථය යන නාමය ලැබෙන්නාක් මෙන් එක් එක් කොටස වෙන් කොට පසෙක තැබූ කල්හි රූපය අතුරුදහන් වේ. එමෙන් ම පංචස්ඛන්ධය වෙන වෙනම සලකා බලන විට පුද්ගලයා කියා ගත හැකි අනන්‍යතාවක් නැත.

මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට හා එයින් මුලා නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග බුදු දහමේ විස්තර කොට ඇත. එහිදී (සප්පටි හාරියං භාසිතං) අර්ථවත් වදන් පැවසිය යුතුය. (අප්පටි හාරියං භාසිත) අනර්ථවත් ප්‍රකාශ නොකළ යුතුය. එමෙන් ම නිශ්චිතාර්ථ ඇති වදන් (නීතත්‍ථ) ප්‍රකාශ කළ යුතුය. එසේම ගම්‍යාර්ථ වදන් ද ඇත. (නෙය්‍යත්‍ථ) ඒවා ද අවබෝධ කරගත යුතුය. මේ අනුව පුද්ගලයා දෘෂ්ටිගතික වීමට හෝ මතවාදවලට එල්බ ගැනීමට යොමු වන බව පැහැදිලි වෙයි.

**නිගමනය**

දෘෂ්ටිගතික වීම හෝ මතවාදවලට එල්බ ගැනීම පුද්ගලයාගේ ආරම්භයේ සිටම කරන ලද්දක් බව නොකිවමනාය. දෘෂ්ටීන්වලට එල්බ නොගැනීමෙන් පුද්ගලයා දර්ශන සම්පත්තියට පැමිණිය යුතුය යන්න බුදුදහම අවධාරණය කරයි. එනම් නිර්වාණය අවබෝධ කර ගැනීමයි. ඒ සඳහා දර්ශන සම්පත්තියට පැමිණිය යුතුය. ආත්මය හෝ මමය මාගේය මම වෙමි යන දෘෂ්ටීන්වලට නොපැමිණ පංචස්ඛන්ධයන් පිළිබඳ සංශ්ලේෂි හා විශ්ලේෂි න්‍යායයෙන් යුතුව ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධයෙන් කිසිදු දෘෂ්ටියකට නොපැමිණ ප්‍රතීත්‍ය සමුප්පාද ධර්මය අවබෝධ කර ගැනීමෙන් මතවාද හෝ දෘෂ්ටිවාදවලින් තොරව ජීවත්වීමට උපදෙස් ලබා දීම බෞද්ධ චින්තනයේ සුවිශේෂත්වයයි. නොයෙක් ආකාරයේ දෘෂ්ටි ජාලා වලින් නිදහස් විය යුතුය. අවිද්‍යාව නිසා දෘෂ්ටි ඇති වෙයි යන්න බුදු දහමේ නිර්දේශයයි. මේ අනුව "මතවාද" පිළිබඳ බෞද්ධ විචාරය අවබෝධකරගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ඛුද්දකනිකාය, I ත්‍රි.බු.ජ.මු. 1972

දීඝනිකාය, I ත්‍රි.බු.ජ.මු. 1972

මජ්ඣිමනිකාය, I ත්‍රි.බු.ජ.මු. 1972

සංයුත්තනිකාය, II ත්‍රි.බු.ජ.මු. 1972

අබේනායක. ඔලිවර්. බෞද්ධ අධ්‍යයන විමර්ශන, මහමිතව පඤ්ඤාරතන හිමි, පහළගම ධම්මික හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන 2009

විවරණ පූජ්‍ය කොස්වත්තේ අරියවිමල හිමි සංස්. මහමිතව පඤ්ඤාරතන හිමි රත්මල්වැටියේ සමිත හිමි මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, මිරිස්වත්ත පුවක් පිටිය, 2009.